ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදනය: HRC/P/i/S/08/01/24

# මාධ්‍ය නිවේදනය

## යුක්තිය මෙහෙයුම

මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලීසිය විසින් ක්‍රියාත්මක කොට සිදුකරගෙන යනු ලබන යුක්තිය මෙහෙයුම පිළිබඳව ශ්‍රී ලංකා මොනව හිමිකම් කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත. 2023 දෙසැම්බර් මස 17 සිට දෙසැම්බර් මස 31 දක්වා දෙසතියක කාලය තුළ මෙම මෙහෙයුම මඟින් සැකකටයුතු පුද්ගලයන් 20,000කට අධික ප්‍රමාණයක් අත්අඩංගුවට ගත් බවට මහජන ආරක්ෂක අමාත්‍යාංශය නිවේදනය කළ බවට වාර්තා වේ.

මත්ද්‍රව්‍ය ජාවාරම් හා සංවිධානාත්මක අපරාධයන් මැඩලීම මෙම මෙහෙයුමේ අරමුණ ලෙස ප්‍රකාශිතය. මත්ද්‍රව්‍ය ජාවාරම හා සංවිධානාත්මක අපරාධ මැඩලීම රජය විසින් සපුරා ගත යුතු වැදගත් අරමුණක් වන බව මෙම කොමිෂන් සභාව අවබෝධයකින් සිටී. කෙසේ වුවද මෙම යුක්තිය මෙහෙයුම සිදුකරගෙන යාමේදී වධහිංසාවට ලක්වීම්, අමානුෂීය හෝ අවමන් සහගත සැළකීම්, අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම් වැනි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සිදුවී ඇති බව සඳහන් පැමිණිලි රාශියක් කොමිසම හමුවේ ගොනුකොට ඇත. මෙම මෙහෙයුම පිළිබඳ දැඩි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් මෑතකදී ප්‍රකාශයට පත්කළ මාධ්‍ය නිවේදනයද අපගේ නිරීක්ෂණයට ලක්ව ඇත. ඒ අනුව මෙම මෙහෙයුම නන්දෙසින් වාර්තා වන්නා වූ අයුක්තියට ලක්වීම් පිළිබඳ සිදුවීම් වල මාතෘකාවක් බවට පත්ව ඇති අතර, එමඟින් මෙම මෙහෙයුමේ නාමය වන 'යුක්තිය' යන වදනද වැරදිව භාවිතා වන්නක් බවට පත්ව ඇත.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් වන ආකාරයට, කිසිම තැනැත්තෙකු වධහිංසා වලට හෝ, කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකීමකට හෝ දඬුවමකට යටත් නොකළ යුතු බව මූලික අයිතිවාසිකමක් ලෙස පවතින බව කොමිෂන් සභාව නැවතත් අවධාරණය කරනු ලබයි. මෙම අයිතිය පරම අයිතියක් හා අහිමි කළ නොහැක්කක් වන අතර, කිසිදු තත්වයක් යටතේවත් සීමාවන්ට

ලක්කිරීම සිදුකළ නොහැකිය. අපරාධ විමර්ශනය කරන්නා වූ හා සැකකරුවන් අත්අඩංගුවට ගන්නා වූ පොලිස් නිලධාරීන් විසින් මෙම අයිතිවාසිකම උල්ලංඝනය නොවන ආකාරයට සෑම අවස්ථාවකදීම කටයුතු කළ යුතු අතර, එහිදී සැකකරුවන්ගේ ගෞරවය නොකෙළසන ලෙස ක්‍රියා කළ යුතුය. පොලීසිය විසින් මෙම මෙහෙයුම සිදුකරන අතරතුරදී ළමයින්ද ඇතුළු පුද්ගලයන් වෙත සිදුකළ බවට වාර්තා වී ඇති කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකීම් පිළිබඳ වූ සිදුවීම් දැනගැනීමට ලැබීම කොමිෂන් සභාවේ කනස්සල්ලට හේතු වී ඇත. එසේම මෙසේ වාර්තා වී ඇති සිදුවීම් පිළිබඳව විමර්ශනය කිරීමට කොමිෂන් සභාව විසින් පියවර ගනිමින් සිටී.

2023 වර්ෂය තුළදී පමණක් වධහිංසාවන්ට ලක්වීම් පිළිබඳ පැමිණිලි 200 කට වඩා වැඩි ප්‍රමාණයක් ලැබී ඇති සන්දර්භයක් තුළ මෙම වාර්තාවන් පිළිබඳ තවදුරටත් කොමිෂන් සභාවේ දැඩි අවධානය යොමු වේ. එමෙන්ම, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් වධහිංසාව සිදුකළ බවට වරදකරුවන් බවට තීරණය කොට අගතියට පත්වූවන් හට වන්දි ගෙවීමට ද නියම කළ ඇතැම් නිලධාරීන් පවා තවදුරටත් තම ධූරයන්ගේ කටයුතු කරන ආකාරය දක්නට ඇත. මෙම නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවට අවධාරණය කරමින් 2023.12.21 වන දින කොමිෂන් සභාව විසින් ගරු නීතිපතිතුමා වෙත ලිපියක් යොමු කළ අතර, ගරු නීතිපතිතුමා විසින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වධහිංසා කළ බවට වරදකරුවන් කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා ලෙස නියෝග කොට ඇති අවස්ථාවන්හිදී නිතිපති දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට සහතික කරමින් 2023.12.28 දිනැති ලිපිය මඟින් මෙම කොමිසමේ ලිපියට ප්‍රතිචාර දක්වා ඇත.

සෑම පුද්ගලයෙකුටම ජීවත් වීමේ අයිතියක් ඇති බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) වගන්තිය මඟින් අදහස් කරනු ලබන බවට මෙම කොමිෂන් සභාව තවදුරටත් අවධාරණය කරනු ලැබේ. මෙම අයිතිය සියළු තැනැත්තන්ට හිමි වන අතර, අපරාධයකට සැකකටයුතු පුද්ගලයෙකුට හෝ අපරාධ නඩු ක්‍රියාමාර්ගයක වරදකරු බවට පත්වූවකු හට වුවද එම අයිතිය එසේම හිමි වන්නේය. කෙසේ වුවද පොලිස් භාරයේ සිටියදී හා අත්අඩංගුවට ගැනීම සිදුකරගෙන යාමේදී සිදුවන්නා වූ මරණ තවදුරටත් ගැටළුවක්ව පවතී. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී 2023 වර්ෂයේ මුල් මාස 6 තුළදී ශ්‍රී ලංකා පොලිස් භාරයේ සිටියදී සිදුවූ මරණ 6 ක් හා අත්අඩංගුවට ගැනීම් සිදුකිරීමේදී සිදුවූ මරණ 2 ක් පිළිබඳව පැමිණිලි ලැබී ඇත. තවදුරටත් රැඳවුම්භාරයේ සිටියදී සිදුවන්නා වූ මරණ පිළිබඳ පොලිස් නිලධාරීන් වගකිවයුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නැවත නැවතත් තම තීන්දු මඟින් ප්‍රකාශයට පත්කොට ඇත. උදාහරණ ලෙස <u>**ෆාතිමා ෂාමිලා එ. ස්ථානාධිපති, පොලිස් ස්ථානය, කොම්පඤ්ඤවීදිය ඇතුළු පිරිස SC FR 398/2018**</u> හිදී කොම්ඤ්ඤවීදිය පොලිස් ස්ථානයට අනුයුක්ත පොලිස් නිලධාරීන් පිරිසක් විසින් පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයාගේ මරණයට වගකිවයුතු බවටත්, එම පොලිස් නිලධාරීන් විසින් මෙම පැමිණිලිකාරිය හට වන්දි මුදලක් ලබාදීම සිදුකළ යුතු බවටත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කරනු ලැබීය. මෙම

නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අවධානය යොමු විය යුතු කරුණක් බවද මැතකදී මෙම කොමිෂන් සභාව විසින් නීතිපති තුමා හට අවධාරණය කරනු ලැබීය. රැඳවුම්භාරයේදී සිදුවන්නා වූ හා අත්අඩංගුවට ගැනීමේදී සිදුවන්නා වූ මරණ සිදුවීම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023.12.11 වන දින ශ්‍රී ලංකා පොලීසිය වෙත මාර්ගෝපදේශ සහ නිර්දේශ නිකුත් කර ඇත. එසේ වුවද, මෙම මාර්ගෝපදේශ සහ නිර්දේශ ප්‍රකාශයට පත්කොට ඉතා සුළු දින කිහිපයක් තුළදී මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහිව උපරිම බලය යොදවන බවට එනම්, ඒ අකාරයෙන් වූ සැකකරුවන් පොලිස් වෙඩි තැබීම් අතරතුරදී අධිකරණමය ක්‍රියාමාර්ග වලින් තොරව මරණයට ලක්වීම විය හැකි බවට ව්‍යංගයෙන් පවසමින් මහජන ආරක්ෂක අමාත්‍යංශයේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයක් සිදුකර ඇති බව දැනගැනීමට ලැබීම මගින් කොමිෂන් සභාව කණස්සල්ලට පත්ව ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) 13(2) 13(3) සහ 13(5) ව්‍යවස්ථා මගින්, සෑම තැනැත්තෙකු හටම අත්තනෝමතික ලෙස සිර භාරයට ගැනීමෙන් හා රඳවා තබාගැනීමෙන් නිදහස්ව සිටීමට, අධිකරණ තීන්දුවකින් තොරව නිදහස අහිමි කිරීමෙන් තොරව සිටීමට, සාධාරණ නඩු ක්‍රියාමාර්ගයක් ලබාගැනීමේ අයිතිය හා වරදකරුවෙකු ලෙස නීතිය මගින් තහවුරු කරන තෙක් නිර්දෝෂී අයකු බවට සැළකිය යුතු බවට වන අයිතීන් පිළිවෙලින් සහතික කොට ඇත. මෙම මූලික අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට මූලික පදනම සපයනු ලැබේ. මත්ද්‍රව්‍ය ජාවාරම් මර්දනයේ නාමයෙන්, අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම් පුද්ගලික වත්කම් භාරයට ගැනීම් හා දේපල විනාශයට පත්කිරීම් මෙන්ම පුද්ගලයන් හා ස්ථානයන් බලහත්කාරයෙන් සෝදිසි කිරීම් මගින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවේ.

තවදුරටත්, පොලීසිය විසින් පෞද්ගලික නිවාස තුළ සෝදිසි කටයුතු සිදුකිරීමේදී හා සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සිදුකිරීමේදී මාධ්‍යකරුවන් තමන් සමඟ කැටුව යන බවටත් එම මෙහෙයුම අතරතුරදී ගනු ලබන වීඩියෝ දර්ශන ජාතික මාධ්‍යයන් මගින් ප්‍රදර්ශනය කිරීම සිදුකරනු ලබන බවටත් වාර්තා වී ඇත. මෙවැනි ක්‍රියාවන් මගින් පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය බරපතල ලෙස උල්ලංඝනය වීම් සිදුවන බවට මෙම කොමිසම නිරීක්ෂණය කරන අතර, 2021.09.23 වන දින මෙම කොමිෂන් සභාව විසින් පොලිස්පතිතුමා වෙත යොමු කරන ලද උපදෙස් නැවතත් අවධාරණය කර සිටිනු ලැබේ. එහිදී කොමිසම මගින් යොමුකරන ලද නිර්දේශයන් සඳහන් කරමින් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට අදාළ පින්තූර හා දර්ශන අවසරයකින් තොරව මාධ්‍ය තුළ ප්‍රචාරය කිරීම තහනම් කරමින් එවකට සිටි පොලිස්පතිවරයා විසින් 2022.02.14 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක RTM 382 සිහිපත්කරනු ලැබේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදේශනාත්මක අදහස් දැක්වීම SC REF/01/2008 හිදී දක්වා ඇති ආකාරයට මේ ආකාරයෙන් පුද්ගලිකත්වය උල්ලංඝනය වන ආකාරයේ ක්‍රියාවන්ට අදාළව මාධ්‍යයන්ට එරෙහිව දිලික්තමය නීති ක්‍රියාමාර්ගයන් ගත හැකි බවද කොමිෂන් සභාව පෙන්වා දී සිටී.

කොමිසම විසින් මෑතකදී ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය පිළිබඳ සිදුකරනු ලැබූ අධ්‍යයනයේදී බන්ධනාගාර තුළ තදබදය යන ගැටළුවට අදාළව නිකුත් කරනු ලැබූ නිර්දේශයන් නැවත සිහිපත් කරනු ලබයි. මෙම යුක්තිය මෙහෙයුම මඟින් සිදුකරනු ලබන විශාල ප්‍රමාණයේ අත්අඩංගුවට ගැනීම් හා රඳවා තබාගැනීම් මඟින් බන්ධනාගාරවල තදබදය සැකයකින් තොරවම තවදුරටත් උග්‍රවිය හැකිය. සිරභාරයේ රඳවා තබා ගැනීම වෙනුවට විකල්ප ක්‍රම හඳුන්වා දීම වැනි ප්‍රගිතිශීලී ප්‍රතිසංස්කරණයන් පිළිබඳව මෑත කාලීනව අධිකරණ අමාත්‍යාංශය විසින් අවධානය යොමු කොට ඇති අවස්ථාවක මෙම මෙහෙයුම මඟින් එකී ක්‍රියාවලිය අවතක්සේරු කිරීමක්, යටපත් කිරීමක් සිදුවේ.

ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතන මඟින් යුක්තියට ගරු කිරීම හා පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් ගරු කරමින් කටයුතු කිරීමට අසමත් වී ඇති නිසා, ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත්කොට ඇති මෙම මෙහෙයුමේ අරමුණ වූ, ‘‘යුක්තිය’’ ඉටුකිරීම යන්න මේ ආකාරයේ මෙහෙයුම් ක්‍රියාවන් මඟින් තවදුරටත් ක්‍රියාත්මක කිරිම සිදුකළ හැකිද යන්න සැකසහිතය. ශ්‍රී ලංකාවේ වර්ථමාන යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට මූලික අභියෝගයක් වී ඇත්තේ, දණ්ඩ මුක්තිකසංස්කෘතියයි. කෲර වධහිංසා පැමිණවීම, රඳවා තබාගැනීමේදී සිදුවූ හා අත්අඩංගුවට ගැනීමේදී සිදුවූ මරණ, අත්තනෝමතික සිරභාරයට ගැනීම් හා රඳවා තබා ගැනීම් වැනි වරදවල් සිදුකිරීම පිළිබඳව, ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් වරදකරුවන් බවට පත්කළ, නීතිය ක්‍රියාත්මක කිරීම සිදුකරනා නිලධාරින්ට එරෙහිව නීතිමය කටයුතු සිදු නොවීම මඟින් මෙම ප්‍රශ්නය තවත් උග්‍රවී ඇත. ඒ අනුව වර්ථමාන නීති බලගැන්වීමේ ක්‍රියාවලිය වෙත යොමුකොට ඇති ප්‍රවේශයේ යෝග්‍යතාවය පිළිබඳව වැඩි අවධානයක් යොමුකරන ලෙසත්, වර්ථමාන ක්‍රමය වෙනුවට පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් හා නීතියේ ආධිපත්‍ය සුරකිමින් මහජන ආරක්ෂාව තහවුරු කිරීම බලගැන්වීම උදෙසා නීතිය බලාත්මක කරන ආයතන විධිමත් ලෙස ප්‍රතිසංස්කරණය කරන ලෙසත්, අතිගරු ජනාධිපතිතුමා සහ මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙතින් මෙම කොමිෂන් සභාව ඉල්ලා සිටී.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2024.01.08